# ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීම පිළිබඳ පනත

**කම්කරු දෙපාර්තමේන්තුව**

# ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීම පිළිබඳ 1956 අංක 47 දරන පනත

**සංශෝධන**

1. 1964 අංක 43 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ ( සංශෝධන ) පනත

2. 1973 අංක 29 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ ( සංශෝධන ) පනත

3. 1984 අංක 32 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීම, කර්මාන්තශාලා සහ සාප්පු සහ කාර්යාලයීය සේවක (සේවා සහ වේතන විධිමත් කිරීමේ) ( සංශෝධන ) පනත

4. 2003 අංක 08 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ ( සංශෝධන ) පනත

5. 2006 අංක 24 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ ( සංශෝධන ) පනත

**රෙගුලාසි**

1958.04.25 දින අංක 11,302 දරන කෙටුම්පත

1958.08.22 දින අංක 11,479 දරන කෙටුම්පත

2010.08.20 දින අංක 1667/41 දරන ගැසට් නියෝගය

2011.03.04 දින අංක 1695/32 දරන ගැසට් නියෝගය

# ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීම පිළිබඳ 1956 අංක 47 දරන පනත

## ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයට ගැනීම ක්‍රමවත් කිරීම සඳහා වූ පනතකි.

**( අනුමත කළ දිනය : 1956 නොවැම්බර් 7 වෙනි දින )**

1964 අංක 43

1973 අංක 29

1984 අංක 32

වර්තමාන පාර්ලිමේන්තුවට රැස් වූ ලංකාවේ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ අනුශාසනය හා අනුමැතිය අනුව හා ඇතිව, එහිම බලය ප්‍රකාර, අත්‍යුත්තම ප්‍රතාපවත් මහා රාජිණිය විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ පනත ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීම පිළිබඳ 1956 අංක 47 දරන පනත යනුවෙන් හැඳින්විය හැකිය.

## 1 වෙනි කාණ්ඩය
## කාර්මික ව්‍යාපාරවල රෑ වැඩ

2. (1) මේ කොටසේ විධිවිධානවලට යටත්ව කිසිම තැනැත්තෙකු විසින් වයස අවුරුදු 18 ට අඩු තැනැත්තෙකු රාජ්‍ය හෝ පෞද්ගලික කාර්මික ව්‍යාපාරයක හෝ එහි ශාඛාවක රාත්‍රී කාලය තුළ කවර වූ අවස්ථාවක දී හෝ සේවයේ නියුක්ත නොකර විය යුතුය.

යම් කාර්මික ව්‍යාපාරයක රාත්‍රී කාලයේදී ස්ත්‍රීන් සේවයේ නියුක්ත කරවීම.

2. (අ) (1) මේ කොටසේ විධිවිධාන වලට යටත්ව කාර්මික ව්‍යාපාරයක සේවයෙහි නියුක්ත කරවන ලද සෑම ස්ත්‍රියකටම රාත්‍රිය මුළුල්ලේම වැඩ කිරීමට අවසර දෙනු ලැබිය යුතුය.

(2) ස්ත්‍රියක් රාත්‍රී කාලයේදී සේවයේ නියුක්ත කරවීම පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව කරනු ලැබිය යුතුය. 1984 අංක 32

(අ) සිය කැමැත්තට විරුද්ධව කිසිම ස්ත්‍රියකට රාත්‍රී කාලයෙහි වැඩ කිරීමට බල කරනු නොලැබිය යුතුය;

(ආ) සෑම සේවා යෝජකයකු විසින්ම, රාත්‍රී කාලයේදී ස්ත්‍රීන් ප. ව. 10.00 න් පසු වැඩ කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවීමට පෙර, කම්කරු කොමසාරිස්වරයාගේ ලිඛිත අනුඥාව ලබාගත යුතුය ;

(ඇ) යම් දිනක පෙ.ව. 6.00 සහ ප. ව. 6.00 අතර කාලය තුළ සේවයෙහි නියුක්ත කරවන ලද කිසිම ස්ත්‍රියක ප. ව. 10.00 න් පසු සේවයෙහි නියුක්ත කරනු නොලැබිය යුතුය;

(ඈ) රාත්‍රී කාලයේදී වැඩ කරන සෑම ස්ත්‍රියක් විසින්ම , ඇය විසින් ලබා ගන්නා සාමාන්‍ය ගෙවීම මෙන් එකහමාරකට නොඅඩු ගෙවීමක් ලැබිය යුතුය ;

(ඉ) රාත්‍රී කාලයේදී වැඩකරන කම්කරු ස්ත්‍රීන්ගේ ශුභසාධනය පිළිබඳව සොයා බැලීම සඳහා කාන්තා පාලිකාවන් පත්කරනු ලැබිය යුතුය ;

(ඊ) රාත්‍රී කාලයේදී වැඩකරන සෑම කම්කරු ස්ත්‍රියකටම සේවා යෝජක විසින් විවේක කාමර සහ කෑම බීම සපයනු ලැබිය යුතුය ;

(උ) යම් එක් මාසයක් තුලදී කිසිම ස්ත්‍රියක දින දහයකට වැඩියෙන් රාත්‍රී වැඩ සඳහා සේවයෙහි නියුක්ත කරවනු නොලැබිය යුතුය.

2. (ආ) 2 අ වගන්තියේ විධිවිධාන -

වගකිවයුතු තනතුරු ආදිය උසුලන ස්ත්‍රීන්ට 2 අ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු බව.

(අ) කළමනාකරණ හෝ ශිල්පීය ස්වභාවයෙහි වගකිව යුතු තනතුරු දරන ස්ත්‍රීන්ට ;

(ආ) සාමාන්‍යයෙන් කය වෙහෙසා කෙරෙන වැඩවල නොයෙදෙන, සෞඛ්‍ය සහ ශුභ සාධන සේවා වල නියුක්ත ස්ත්‍රීන්ට

සහ

(ඇ) එකම පවුලේ සාමාජිකයන් පමණක් සේවයෙහි නියුක්ත කාර්මික ව්‍යාපාරයකට අදාළ නොවිය යුතුය.

කාර්මික ව්‍යාපාර වල රාත්‍රී කාලයේ ස්ත්‍රීන් සේවයෙහි නියුක්ත කරවීම අමාත්‍යවරයා විසින් තහනම් කළ හැකි බව.

2. (ඇ) බරපතල හදිසි අවස්ථාවකදී මහජන යහපත අනුව, අවශ්‍ය වන විට, අමාත්‍යවරයා විසින් සම්බන්ධිත සේව්‍ය සහ සේවක සංවිධාන වෙතොත්, ඒවා විමසීමෙන් පසු, යම් කාර්මික ව්‍යාපාරයක හෝ ව්‍යාපාරවල හෝ එහි ශාඛාවල, රාත්‍රී කාලයේදී ස්ත්‍රීන් සේවයෙහි නියුක්ත කරවීමට අදාළ වූ 2(අ) වගන්තියේ දක්වා ඇති කොන්දේසි වෙනස් කිරීම හෝ රාත්‍රී කාලයේ ස්ත්‍රීන් සේවයෙහි නියුක්ත කරවීම තහනම් කිරීම හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කරනු ලැබිය හැකිය.

3. (1) මීට සම්බන්ධ වූ සේව්‍ය හා සේවක සංවිධානයන් කිසිවක් ඇතොත්, ඒවායේ අදහස් විමසීමෙන් පසු, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියෝගයකින්, එකී නියෝගයෙහි විශේෂයෙන් සඳහන් පරිදි නොකඩවාම පවත්වාගෙන යා යුතු යම් කාර්මික ව්‍යාපාරයක හෝ ව්‍යාපාරවල ආධුනිකයන් වශයෙන් නැතහොත් වෘත්තිය පුහුණුව සඳහා වයස අවුරුදු දහසයට එළඹ සිටින, එහෙත් වයස අවුරුදු දහඅටෙන් පහළ තැනැත්තන් රාත්‍රී කාලයෙහි සේවයෙහි යෙදීමට අවසර දීමට ඇමතිවරයාට පිළිවන. 1964 අංක 43

(2) කිසියම් කාර්මික ව්‍යාපාරයක මැඩ පැවැත්විය නොහැකි වූ ද, නැතහොත් කලින් දැනගත නොහැකි වූ ද, තාවකාලික ස්වභාවයකින් යුක්ත නොවන්නා වූ ද, එහි ව්‍යාපාරයක සාමාන්‍ය ක්‍රියා මාර්ගයට බාධා පමුණුවන්නා වූ ද, යම් ආපදාවක් ඇති වුවහොත්, එවිට මෙකී ආපදාව සිදු වී දින හතක් ඇතුළත දී කම්කරු කොමසාරිස්වරයා වෙත

ඒ බව වාර්තා කරනු ලැබුවහොත්, එකී ආපදාව පවතින කාලය තුළ , වයස අවුරුදු 18 න් පහළ තැනැත්තන් රාත්‍රී කාලයේදී සේවයෙහි යෙදීම පිළිබඳව 2 වෙනි වගන්තියේ සඳහන් විධිවිධාන එකී ව්‍යාපාරයේ සේවයෙහි නියුක්ත වී සිටින වයස අවුරුදු දහසයටත්, දහඅටටත් අතර තැනැත්තන් සම්බන්ධයෙන් ක්‍රියාවේ නොයෙදිය යුතුය.

(3) බරපතල ආපදාවක් ඇති වූ අවස්ථාවකදී, මහජනතාභිවෘද්ධිය සඳහා අවශ්‍ය වුවහොත්, ඊට සම්බන්ධ වූ සේවා හා සේවක සංවිධානයන් කිසිවක් ඇතොත් ඒවායේ අදහස් විමසීමෙන් පසු, යම් කාර්මික ව්‍යාපාරයක හෝ ව්‍යාපාරවල හෝ එබඳු ව්‍යාපාරයක ශාඛාවල වයස අවුරුදු දහඅටෙන් පහළ තැනැත්තන් රාත්‍රී කාලයේදී සේවයෙහි තහනම් කිරීම, වයස අවුරුදු 16 ටත්, 18 ටත් අතර තැනැත්තන් සම්බන්ධයෙන් පමණක්, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියෝගයකින් ඇමතිවරයා විසින් අත්හිටවිය හැකිය.

(4) එසේ කිරීම යෝග්‍ය යයි ඇමතිවරයා කල්පනා කරයි නම්, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියෝගයකින්, පස්වරු 7.00 සිට පස්වරු 11.00 දක්වා වූ රාත්‍රි කාලය තුළ කිසියම් කාර්මික ව්‍යාපාරයක හෝ එවැන්නක යම් ශාඛාවක ස්ත්‍රීන් හා තරුණ අය සේවයෙහි යොදනු ලැබීමට ඇමතිවරයා විසින්, එසේ සේවයෙහි යොදනු ලබන කිසිම තරුණ අයෙකුට පස්වරු 11.00 ළඟට එළඹෙන පැය එකොළහ ඇතුළත කිසියම් වේලාවක එබඳු ව්‍යාපාරයක හෝ ශාඛාවක සේවය කරන ලෙස නියම නොකළ යුතුය. නැතහොත් අවසර නොදිය යුතුය යන කොන්දේසියට යටත්ව අවසර දිය හැකිය. 1984 අංක 32

(5) මේ කොටසේ, වයස අවුරුදු 18 න් පහළ තැනැත්තන් සම්බන්ධයෙන් වූ විධිවිධාන, දෙමවුපියන් හා ඔවුන්ගේ දරුවන් නැතහොත් ඔවුන් යටතේ ඇති බාලයන් පමණක් සේවයෙහි යොදවනු ලබන පවුලේ කටයුත්තක දී අවැඩදායක හෝ අහිතකර හෝ අනතුරු සහිත නොවන්නේ යයි ඇමතිවරයා විසින් සලකනු ලබන වැඩ සඳහා එබඳු තැනැත්තන් යෙදවීම කෙරෙහි අදාළ වීමෙන් නිදහස් කිරීම පිණිස ව්‍යවස්ථා පැනවිය හැකිය.

4\. (1) වයස අවුරුදු දහසයට එළඹ සිටින එහෙත් අවුරුදු දහඅටට පහළ තැනැත්තෙක් 3 වෙනි වගන්තියේ අංක (3) දරන උප වගන්තිය යටතේ බලය පැවරීමක් පිට ආධුනිකත්වයේ කාර්ය සඳහා හෝ වෘත්තීය පුහුණුව සඳහා යම් කාර්මික ව්‍යාපාරයක රාත්‍රී කාලයේදී සේවයෙහි යොදනු ලබන කළ වැඩ කරන කාලසීමා දෙකක් අතර යටත්පිරිසෙයින් පිට පිට පැය දහතුනක විවේක කාලයක් එකී ව්‍යාපාරයේ සේවා පක්ෂය විසින් ඔහුට ලබාදිය යුත්තේය.

රෑ වැඩ පිණිස සේවයෙහි යොදනු ලබන ආධුනිකයන් හෝ වෘත්තීය පුහුණුව ලබන්නන් සඳහා විවේක කාලය

(2) යම් තැනැත්තෙක් මේ වගන්තියේ අංක (1) දරන උප වගන්තිය උල්ලංඝනය කරන්නේ නම් ඔහු වරදකට වැරදි කරුවකු වී, මහේස්ත්‍රාත් වරයකු ඉදිරිපිටදී කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු, වරදකරු යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට

2002 II කොටස අතිරේකය

2003 අංක 08

හෝ එකී දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

5. (1) ප්‍රසිද්ධ හෝ පෞද්ගලික කාර්මික ව්‍යාපාරයක සේවා පක්ෂය විසින් එකී ව්‍යාපාරයේ සේවයෙහි යෙදී සිටින වයස අවුරුදු දහ අටෙන් පහළ සියලු තැනැත්තන්ගේ නාම, උපන් දින සහ වැඩ කරන වේලාවන් ඇතුළත් ලේඛනයක් තබා ගත යුතුය. වයස අවුරුදු දහ අටෙන් පහළ කාර්මික සේවකයන්ගේ නාම ලේඛන

(2) යම් තැනැත්තෙක් මේ වගන්තියේ අංක (1) දරන උප වගන්තිය උල්ලංඝනය කරන්නේ නම්, ඔහු වරදකට වරදකරුවකු වී, මහේස්ත්‍රාත් වරයකු ඉදිරිපිටදී කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු, වරදකරු යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ දෙවන හෝ තදන්තර වරදක් සම්බන්ධයෙන් රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතුය. 2003 අංක 08 (සංශෝධනය)

6. (1) ප්‍රසිද්ධ හෝ පෞද්ගලික කාර්මික ව්‍යාපාරයක වයස අවුරුදු දහඅටෙන් පහළ තැනැත්තන් සේවයෙහි යොදන අය විසින්, වයස අවුරුදු දහඅටෙන් පහළ තැනැත්තන් සම්බන්ධව මේ කොටසේ ඇතුළත් විධිවිධාන එකී විධිවිධාන වල සිංහල හා දෙමළ පරිවර්තනයක් ද සමඟ එකී ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානය ඇතුළත යම්කිසි ප්‍රකට තැනක ප්‍රදර්ශනය කොට තැබිය යුතුය. 2003 අංක 08 (සංශෝධනය)

(2) යම් තැනැත්තෙක් මේ වගන්තියේ අංක (1) දරන උප වගන්තිය උල්ලංඝනය කරන්නේ නම්, ඔහු වරදකට වරදකරුවකු වී, මහේස්ත්‍රාත් වරයකු ඉදිරිපිටදී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ දෙවන තදන්තර වරදක් සම්බන්ධයෙන් රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතුය. 2003 අංක 08 (සංශෝධනය)

## 11 වෙනි කාණ්ඩය
## කාර්මික ව්‍යාපාරවල සහ සමුද්‍ර සේවයෙහි යෙදීම

7. (1) මේ වගන්තියේ අංක (2) දරන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, කිසිම තැනැත්තකු ප්‍රසිද්ධ හෝ පෞද්ගලික කාර්මික ව්‍යාපාරයක හෝ එබන්දක ශාඛාවක කිසිම ළමයකු සේවයෙහි නොයෙදවිය යුතුය.

(2) අංක (1) දරන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුත්තේ -

(අ) රජයේ අවසරය පිට අනුමත කරනු ලැබ, පාලනය කරනු ලැබෙතොත්, කාර්මික පාසැල්වල ළමයින් විසින් කරනු ලබන වැඩට ය.

(3) මේ වගන්තියේ අංක (1) දරන උප වගන්තිය උල්ලංඝනය කරමින් ළමයකු සේවයෙහි යොදවනු ලබන විට, සේවා යෝජකයා ද , යථෝක්ත උල්ලංඝනය කිරීම යමෙකුගේ ක්‍රියාවකට හෝ පැහැර හැරීමකට පැවරිය හැකි නම් ( සේවයෙහි යොදනු ලබන ළමයා හැර )

ඒ තැනැත්තාද වරදකට වරදකරු වී, මහේස්ත්‍රාත් වරයකු ඉදිරිපිටදී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු, ඔවුන් වරදකරුවන් යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ එබඳු බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු අතර වරද සිදුකරනු ලැබුවේ කවර ළමයකු සම්බන්ධයෙන් ද ඒ ළමයා වෙත අධිකරණය විසින් නිශ්චය කරනු ලැබූ වන්දි මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතුය.

8\. (1) ප්‍රසිද්ධ හෝ පෞද්ගලික කාර්මික ව්‍යාපාරයක සේවා යෝජකයා විසින් එකී ව්‍යාපාරය යටතේ සේවයෙහි නියුක්ත සියලු ස්ත්‍රීන්ගේ හා සියලු තරුණ අයවලුන්ගේ නාම හා උපන් දින ඇතුළත් ලේඛනයක් තබාගත යුතුය.

(2) යමෙක් මේ වගන්තියේ අංක (1) දරන උප වගන්තිය උල්ලංඝනය කරන්නේ නම්, ඔහු වරදකට වරදකරුවකු වී, මහේස්ත්‍රාත් වරයකු ඉදිරිපිටදී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ දෙවන හෝ තදන්තර වරදක් සම්බන්ධයෙන් රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතුය.

8\. අ (1) යම් කාර්මික ව්‍යවසායක සේවයෙහි නියුක්තව සිටින යම් තරුණ අයකුගේ සේවා යෝජකයා විසින් සහ එකී තරුණ අයගේ දෙමාපියන් හෝ භාරකරු විසින්, යම් බලයලත් නිලධරයකු විසින් ඉල්ලා සිටිනු ලබන්නේ නම්, එකී තරුණ අයගේ සේවා නියුක්තිය පිළිබඳව එකී නිලධරයා විසින් ඉල්ලා සිටිනු ලබන ආකාරයේ තොරතුරු, එකී නිලධරයාට සැපයිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උප වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ කාර්මික ව්‍යවසායක යම් තරුණ අයකුගේ සේවා නියුක්තිය පිළිබඳව බලයලත් නිලධරයකුට හිතාමතාම වැරදි තොරතුරු සපයන යම් සේවායෝජකයකු, දෙමව්පියන් හෝ භාරකරුවකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත් වරයකු ඉදිරිපිටදී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ එබඳු බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතුය.

9\. (1) මේ වගන්තියේ අංක (2) හා (3) දරන උප වගන්තිවල විධිවිධාන වලට යටත් ව -

(අ) බ්‍රිතාන්‍ය නෞකාවක් වශයෙන් ලංකාවේ ලියාපදිංචි කරනු ලැබූ නැතහොත් ලංකාවේ පදිංචි වූ හෝ ලංකාවේ වෙළඳ ව්‍යාපාරයක් පවත්වන්නා වූ යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන් සමූහයකට අයිති යාත්‍රාවක ප්‍රධානියා විසින් එකී යාත්‍රාවේ සේවය සඳහා වයස අවුරුදු

පහළොවට අඩු තැනැත්තකු නොයෙදවිය යුතුය.

තවද,

(ආ) අන්කිසි යාත්‍රාවක ප්‍රධානියා විසින් වයස අවුරුදු පහළොවට අඩු තැනැත්තකු ලංකාවේ දී එකී යාත්‍රාවේ සේවය සඳහා නොයෙදවිය යුතුය.

(2) මේ වගන්තියේ අංක (1) දරන උපවගන්තිය අදාළ නොවිය යුත්තේ -

(අ) රජයේ අවසරය පිට අනුමත කරනු ලැබ, පාලනය කරනු ලැබෙතොත්, පාසැල් නෞකාවල හෝ අභ්‍යාස නෞකාවල සේවයෙහි නියුක්ත වයස අවුරුදු පහළොවට අඩු තැනැත්තන් විසින් කරනු ලබන වැඩට ය.

(3) ව්‍යවස්ථානුකූලව ඒ සඳහා නම් කරන ලද බලධරයා විසින්, වයස දහ හතරට එළඹ සිටින්නා වූද, අවුරුදු පහළොවට අඩු වූ ද, තැනැත්තකු, එබඳු තැනැත්තකුගේ සෞඛ්‍යයත් ශාරීරික තත්වයත් මෙන්ම, යෝජිත සේවයෙන් බලාපොරොත්තු විය හැකි ම යහපත හා අප්‍රමාදව සිදුවන යහපත ද ගැන නිසිලෙස සලකා බැලීමෙන් පසු, එලෙස සේවයෙහි නියුක්ත වීම එකී තැනැත්තාට ප්‍රයෝජනවත් වනු ඇතැයි එකී බලධරයාට ඒත්තු ගියහොත්, ඔහුට යාත්‍රාවක සේවයෙහි යෙදීමට අවසර දෙමින් සහතිකයක් නිකුත් කිරීමට විධිවිධාන යෙදීම සඳහා ව්‍යවස්ථා පැනවිය හැකිය.

(4) මේ වගන්තියේ අංක (1) දරන උප වගන්තිය උල්ලංඝනය කරමින් යමකු සේවයෙහි යොදනු ලබන විට, සේවා යෝජකයාද, යථෝක්ත උල්ලංඝනය කිරීම යමකුගේ ක්‍රියාවකට හෝ පැහැර හැරීමකට පැවරිය හැකි නම් ( සේවයෙහි යෙදනු ලබන තැනැත්තා හැර ) ඒ තැනැත්තා ද, වරදකට වැරදකරුවන් වී, මහේස්ත්‍රාත් වරයකු ඉදිරිපිටදී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු, ඔවුන් වරදකරුවන් යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ එබඳු බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු අතර ඊට අමතරව වරද සිදුකරනු ලැබුවේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වන්දි මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස සේවා යෝජකට ආඥාවක් කරනු ලැබිය යුතුය.

10. (1) බ්‍රිතාන්‍ය නෞකාවක් වශයෙන් ලංකාවේ ලියාපදිංචි කරනු ලැබූ නැතහොත් ලංකාවේ පදිංචි වූ හෝ ලංකාවේ වෙළඳ ව්‍යාපාරයක් පවත්වන්නා වූ යම් තැනැත්තකුට හෝ තැනැත්තන් සමූහයකට අයිති යාත්‍රාවක ප්‍රධානයා විසින් එකී යාත්‍රාවේ සේවයෙහි නියුක්ත වයස අවුරුදු දහසයෙන් පහළ සියලුදෙනාගේ නම් සහ උපන් දින සහිත නාමලේඛනයක් හෝ එබඳු නම් හා උපන් දින දක්වන ලැයිස්තුවක් එකී යාත්‍රාවේ නාවික පිරිස හා සමඟ ඇතිකර ගන්නා ලද ගිවිසුම් වගන්තිවලට ඇතුළත්ව තබාගත යුතුය.

(2) යම් තැනැත්තෙක් මේ වගන්තියේ අංක (1) දරන උප වගන්තිය උල්ලංඝනය කරන්නේ නම්, ඔහු වරදකට වැරදිකරු වී මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු, වැරදි කරු යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ දෙවන හෝ තදන්තර වරදක් සඳහා රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතුය.

11. (1) යාත්‍රාවක සේවයෙහි නියුක්ත යම් තරුණ තැනැත්තකු ගේ සේවා යෝජකයාද, එකී තැනැත්තාගේ පියා හෝ මව නැතහොත් භාරකරු, බලය ලත් නිලධාරියකු විසින් නියම කරනු ලැබුවහොත්, එකී තරුණ තැනැත්තා සේවයෙහි යෙදීම පිළිබඳ තොරතුරු යථෝක්ත නිලධාරියා නියම කරන පරිදි ඔහු වෙත සැපයිය යුතුය.

(2) යම් සේවා යෝජකයෙක්, පියෙක් හෝ මවෙක් නැතහොත් භාරකරුවෙක් මේ වගන්තියේ අංක (1) දරන උප වගන්තියට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වේ නම්, හෝ යාත්‍රාවක් සේවයෙහි නියුක්ත යම් තරුණ තැනැත්තකු පිළිබඳව අසත්‍ය තොරතුරු බලය ගත් නිලධාරියකුට තම ඕනෑකමින්ම සපයයි නම්, ඔහු වරදකට වැරදිකරුවකු වී මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිටදී කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු, වැරදිකරු යයි ප්‍රකාශ කරනු ලැබූ විට රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ එබඳු බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතුය.

## 111 වෙනි කාණ්ඩය

## කාර්මික ව්‍යාපාරවල සහ සමුද්‍ර සේවයෙහි නියුක්ත වීම හැර සෙසු ආකාරයට සේවයෙහි යෙදවීම

12. මේ පනතේ මේ කාණ්ඩය, කාර්මික ව්‍යාපාරවල සහ සමුද්‍ර සේවයෙහි නියුක්ත වීම හැර සෙසු ආකාරයට සේවයෙහි යෙදවීම සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

13. (1) මේ පනතේ මේ කොටසේ විධිවිධානවලට අනුකූලව හැර කිසිදු ළමයකු සේවයෙහි නියුක්ත කරවනු නොලැබිය යුතු ය.

(2) (1) වන උප වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ළමයකු සේවයෙහි නියුක්ත කරවනු ලබන අවස්ථාවක, ඒ උල්ලංඝනය කිරීම ආරෝපණය කරනු ලැබිය හැක්කේ කාගේ ක්‍රියාවකට හෝ පැහැර හැරීමකට ද ඒ ක්‍රියාව හෝ පැහැර හැරීම කරන සේවා යෝජකයා හෝ ( සේවයෙහි නියුක්ත කරවනු ලැබූ ළමයා හැර ) වෙනත් යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී , රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී

දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඩුවම් දෙකටම යටත් විය යුතු අතර ඊට අමතරව වරද සිදුකරනු ලැබුවේ කවර ළමයකු සම්බන්ධයෙන් ද ඒ ළමයා වෙත අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමාණයක වන්දි මුදලක් ගෙවන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතුය.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.

14. (1) ළමයකු --

(අ) දිනපතා, පාසල ආරම්භ වීමේ විධිමත් වේලාවන්ට පෙර හෝ පාසල අවසන් වීමේ වේලාවට පසුව ඔහුගේ දෙමව්පියන් හෝ භාරකරු විසින්, ඒ පවුලේම සාමාජිකයන් විසින් කරගෙන යනු ලබන සැහැල්ලු කෘෂිකාර්මික හෝ උද්‍යාන වැඩ කටයුතු වල හෝ ඒ හා සමාන වැඩ කටයුතුවල හැර

හෝ

(ආ) යම් රාජ්‍ය අධිකාරියක් විසින් අධීක්ෂණය කරනු ලබන්නා වූ සහ යම් වෙලෙඳාමක් හෝ රැකියාවක් සඳහා යම් තාක්ෂණික අධ්‍යයනයක් හෝ අන් පුහුණුවක් ලබා දෙන්නා වූ යම් පාසලක් හෝ අන් ආයතනයක හැර,

සේවයේ නියුක්ත කරවනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ යම් විධිවිධානයක් උල්ලංඝනය කොට ළමයකු සේවයේ නියුක්ත කරවනු ලැබුවේ නම්, ඒ උල්ලංඝනය කිරීම ආරෝපණය කරනු ලැබිය හැක්කේ කාගේ ක්‍රියාවකට හෝ පැහැර හැරීමකට ද, ඒ ක්‍රියාව හෝ පැහැර හැරීම කරන සේවා යෝජකයා හෝ වෙනත් යම් තැනැත්තකු ( සේවයෙහි නියුක්ත කරවනු ලැබූ ළමයා හැර ) මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහක කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඩුවම් දෙකටම යටත් විය යුතු අතර ඊට අමතරව වරද සිදුකරනු ලැබුවේ කවර ළමයකු සම්බන්ධයෙන් ද ඒ ළමයා වෙත අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමාණයක වන්දි මුදලක් ගෙවන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතුය.

15. යම් ළමයෙක් තම සෞඛ්‍යයට හෝ කායික සංවර්ධනයට හෝ හානි පමුණුවන නැතහොත් ස්වකීය ඉගෙනීමෙන් නිසි ප්‍රතිඵල ලබා ගැනිමට තමා නුසුදුසු බවට පත්කරවන අන්දමේ ස්වභාවයකින් සේවයෙහි යොදවනු ලැබේ යයි ලියාපදිංචි කරනු ලැබූ වෛද්‍යවරයෙකුගේ වාර්තාවකින් හෝ අන් ලෙසකින් බලය ලත් නිලධාරියකුට ඒත්තු ගියහොත්, එලෙස සේවයෙහි යෙදීමට මේ පනතේ මේ කොටසේ විධිවිධාන මගින් බලය දෙනු ලැබිය හැකි නමුදු,

එකී ස්වභාවයෙන් හෝ අන්කිසි අන්දමකින් හෝ බලය ලත් නිලධාරී තැන සුදුසු යයි සිතන පරිද්දෙන් එකී ළමයා සේවයෙහි යෙදීම තහනම් කිරීමට නැතහොත් ඊට කොන්දේසි නියම කිරීමට ඔහුට පිළිවන.

16. (1) යම් ළමයකුගේ සේවා යෝජක සහ ඒ ළමයාගේ මව්පියන් අත්භාරකරු හෝ භාරකරු ද, බලය ලත් නිලධාරියකු විසින් නියම කරනු ලැබුවහොත්, ළමයා සේවයෙහි යෙදීම පිළිබඳව, එකී බලය ලත් නිලධාරී තැනට වුවමනා විය හැකි පරිද්දෙන්, තොරතුරු බලය ලත් නිලධාරී තැන වෙත සැපයිය යුතුය.

(2) මේ වගන්තියේ අංක (1) දරන උප වගන්තිය අනුව, ක්‍රියාකිරීම පැහැර හරින්නා වූ, නැතහොත් යම් ළමයකු සේවයෙහි යෙදීම පිළිබඳව අසත්‍ය තොරතරු බලයලත් නිලධාරියකු වෙත ඕනෑකමින්ම ඉදිරිපත් කරන්නා වූ යම් සේවා යෝජකයකු, මව්පියන් අත්භාරකරු හෝ භාරකරු වරදකට වැරදිකරුවී, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු, වැරදිකරු යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඩුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

17. (1) කිසිම තැනැත්තකු විසින් -

(අ) යම් ලිඛිත නීතියක විධිවිධාන අනුව, පාසැලට යාමෙන් ළමයකු වළක්වන අන්දමින් ඒ ළමයා සේවයෙහි නොයෙදිය යුතුය. නැතහොත්

(ආ) 15 වෙනි වගන්තිය යටතේ, ළමයකු සේවයෙහි යෙදීම සම්බන්ධයෙන්, නිකුත් කරන ලද යම් තහනම් කිරීමක් හෝ සීමා කිරීමක් හෝ සඳහන් දැන්වීමක් ලැබ, එකී තහනම හෝ සීමාකිරීම උල්ලංඝනය කරන අයුරින් එකී ළමයා සේවයෙහි නොයෙදිය යුතුය.

(2) මේ වගන්තියේ අංක ( 1) දරන උප වගන්තිය උල්ලංඝනය කරන තැනැත්තකු වරදකට වරදකරු වී මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු, වැරදිකරු යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඩුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර ඊට අමතරව වරද සිදුකරනු ලැබුවේ කවර ළමයකු සම්බන්ධයෙන් ද, ඒ ළමයා වෙත අධිකරණය

විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වන්දි ප්‍රමාණයක් ගෙවන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතුය.

18. (1) නරඹන්නන් අතරින් යමකු ගෙන් ඇතුළත්වීම සඳහා හෝ අන්කිසි කාර්යයක් සඳහා යම් මුදලක් අයකරනු ලබන යම් විනෝද උත්සවයකට ළමයකු සහභාගී නොවිය යුතුය.

(2) මේ වගන්තියේ අංක (1) දරන උප වගන්තිය උල්ලංඝනය කරමින් විනෝද උත්සවයකට ළමයකුට සහභාගි වන්නට කටයුතු සලස්වන්නා වූ හෝ ඒ සඳහා ළමයකු සපයා දෙන්නා වූ නැතහොත් ඔහුගේ මව හෝ පියා වශයෙන් එසේ කරන්නට ඔහුට අවසර දෙන්නා වූ සෑම කෙනෙකුම වරදකට වැරදිකරු වී, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු, වැරදිකරු යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර ඊට අමතරව වරද සිදුකරනු ලැබුවේ කවර ළමයකු සම්බන්ධයෙන් ද, ඒ ළමයා වෙත අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වන්දි මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතුය.

(3) යම් පුණ්‍යාධාර කටයුත්තකට හෝ අධ්‍යාපන කටයුත්තකට සංවිධායකයින්ගේ පුද්ගලික ලාභ ප්‍රයෝජන හැර අන්කිසි කාර්යයක් සඳහා, ශුද්ධ ලාභ යොදනු ලබන්නා වූ නැතහොත් රජයේ අවසරය පිට පාලනය වන යම් පාසලක සිසුන් විසින් හෝ යම් ආධුනික නාට්‍ය සංගමයක් විසින් ඉදිරිපත් කරනු ලබන විනෝද උත්සවයකට නැතහොත් යම් පාසැලක් මගින් ස්වකීය සිසුන්හට ලබා දෙන්නට බාරගන්නා ලද යම් පුහුණුවක කොටසක් වන අන්කිසි රඟ දැක්වීමකට ගාස්තුවක් හෝ පාරිතෝෂික මුදලක් නොමැතිව සහභාගි වන, ළමයකු සම්බන්ධයෙන් මේ වගන්තියෙහි මීට කලින් සඳහන් විධිවිධාන අදාළ නොවිය යුතුය.

19. (1) ස්වකීය ජීවිතය හෝ අවයව අනතුරට පත්කරනු ලබන ප්‍රසිද්ධ රඟ දැක්වීම්වලට වයස අවුරුදු දහඅටෙන් පහළ කිසිම තැනැත්තකු සහභාගී නොවිය යුතුය.

(2) මේ වගන්තියේ අංක (1) දරන උප වගන්තියෙහි සඳහන් පරිදි එබඳු රඟ දැක්වීමකට ළමයකුට සහභාගිවන්නට කටයුතු සලස්වන්නා වූ හෝ ඒ සඳහා ළමයකු සපයා දෙන්නා වූ, නැතහොත්, ඔහුගේ මව හෝ පියා වශයෙන් එසේ කරන්නට ඔහුට අවසර දෙන්නා වූ සෑම කෙනෙකුම වරදකට වැරදිකරු වී, මහෙස්ත්‍රාත් වරයකු ඉදිරිපිට දී කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු, වැරදිකරු යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් දස දහසක්

නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර වරද සිදුකරනු ලැබුවේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා වෙත අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වන්දි මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතුය.

20. (2) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලැබ, ක්‍රියාවේ යෙදෙන බලපත්‍රයක කොන්දේසිවලට යටත්ව හා ඊට අනුකූලව මිස, අනතුරු සහිත රඟ දැක්වීම්වලට සහභාගිවීම සඳහා වයස අවුරුදු දහ හතරට එළඹ සිටින්නා වූද, එහෙත් වයස අවුරුදු දහසයට අඩුවූද, කිසිම තැනැත්තකු පුහුණු කරනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තිය උල්ලංඝනය කරමින්, අනතුරු සහිත රඟ දැක්වීම් වලට යම් තැනැත්තකුට සහභාගි වන්නට කටයුතු සලස්වන්නා වූ හෝ ඒ සඳහා යම් තැනැත්තකු සපයා දෙන්නා වූ, නැතහොත්, ඔහුගේ මව හෝ පියා වශයෙන් එසේ කරන්නට ඔහුට අවසර දෙන්නා වූ සෑම කෙනෙකුම වරදකට වැරදිකරු වී, මහෙස්ත්‍රාත් වරයකු ඉදිරිපිට දී කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු, වැරදිකරු යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් දස දහසකට නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර ඊට අමතරව වරද සිදුකරනු ලැබුවේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා වෙත අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වන්දි මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතුය.

(4) වයස අවුරුදු දහසය එළඹ සිටින්නාවූ ද, එහෙත් වයස අවුරුදු දහඅටකට අඩු වූද, තැනැත්තකුට අනතුරු සහිත රඟ දැක්වීම් වලට සහභාගිවීම සඳහා බල පත්‍රයක් නිකුත් කිරීමට බලය ලත් නිලධාරියකුට පුළුවන.

(5) අනතුරු සහිත රඟ දැක්වීම්වලට සහභාගිවීම සඳහා යම් තැනැත්තකු පුහුණු කිරීමට මේ වගන්තිය යටතේ බල පත්‍රයක් ලබාගැනීමට බලය ලත් නිලධාරියකු වෙත ඉල්ලීමක් ලැබී ඇති අවස්ථාවකදී, එකී නිලධාරී තැන විසින්,

(අ) පුහුණුව ලැබීමම බලාපොරොත්තුවෙන් සිටින තැනැත්තාගේ සෞඛ්‍යයට පුහුණුව මගින් හානි පැමිණේ ද නැති ද යන වග සඳහන් සහතිකයක් සෞඛ්‍ය

දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරියකු ගෙන් ඉදිරිපත් කරන ලෙස ඉල්ලුම්කරු වෙත හෝ

(ආ) බලපත්‍රය නිකුත් නොකිරීමට හේතු ඇති ද නැති ද යන වග සොයාබලා වාර්තා කරන ලෙස පොලිස් අධිකාරී තැන වෙත හෝ අන්කිසි පොලිස් නිලධාරියකු වෙත හෝ, නියෝගයේ විශේෂයෙන් නියමිත නිලධාරියකු වෙත හෝ නියෝගයක් නිකුත් කළ හැකිය.

එබඳු ඉල්ලීමක් ගැන තීරණයකට එළඹෙන විට එබඳු සහතිකයක් හෝ වාර්තාවක් බලය ලත් නිලධාරී තැන විසින් සැළකිල්ලට භාජන කළ යුතුය.

(6) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන බල පත්‍රයක, එකී බලපත්‍රයට අනුව පුහුණු කළයුතු තැනැත්තා පුහුණුව ලබන ස්ථානය හෝ ස්ථාන විශේෂයෙන් නියම විය යුතුය. තවද, එකී තැනැත්තාගේ ආරක්ෂාව සඳහා, බලය ලත් නිලධාරී තැනගේ අදහස පරිදි , අවශ්‍ය කොන්දේසි ඊට ඇතුළත් විය යුතුය. පුහුණුව ලැබීමට බලාපොරොත්තුවෙන් සිටින තැනැත්තා පුහුණුව ලැබීමට සුදුසුව හා ඊට කැමැත්තෙන් සිටින බවද, ඔහුගේ සෞඛ්‍යය හා ඔහුට සුහද සැළකිලි ලැබීමත් ආරක්ෂා වීමට නිසි විධිවිධාන යොදා ඇති බවද බලය ලත් නිලධාරී තැනට ඒත්තු ගියහොත්, බල පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප නොකළ යුතුය.

(7) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ බල පත්‍රයක් යම් තැනැත්තකු විසින් හේතු පෙන්වනු ලැබූ කල, බලය ලත් නිලධාරියකු විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.

20. (අ) (1) වයස අවුරුදු දහඅටකට අඩු කිසිම තැනැත්තෙක්, (2) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් මාර්ගෝපදේශවලට අනුව නියම කරනු ලබන යම් උපද්‍රවකාරී රැකියාවක, සේවයේ නියුක්ත කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා උපද්‍රවකාරී රැකියා නියම කිරීමේ දී, කරනු ලබන රැකියාවේ ස්වභාවය හෝ ඒ රැකියාව කරගෙන යනු ලබන්නේ යම් අවස්ථාවන් යටතේ ද, එකී අවස්ථාවන් (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ සදාචාරයට එම රැකියාවේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු විය හැකි හානියද, අමාත්‍යවරයා විසින් සැලකිල්ලට ගත යුතුය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් වයස අවුරුදු දහඅටකට අඩු තැනැත්තකු සේවයේ නියුක්ත කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත් වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේදී, රුපියල් දස දහසකට නොවැඩි දඩයකට

හෝ මාස දොළහකට නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ එම තැනැත්තා යටත් විය යුතු අතර, ඊට අමතරව වරද සිදුකරනු ලැබුවේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා වෙත අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වන්දි මුදල් ද ගෙවන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතුය.

## IV වෙනි කාණ්ඩය
## සෑම අයුරින් ම සේවයෙහි යෙදීමට අදාළ වන විධිවිධාන

21. (1) මේ වගන්තියේ අංක (2) දරන උප වගන්තියට යටත්ව තරුණ අය සේවයෙහි යෙදීම සම්බන්ධයෙන් නියෝග පනවනු ලැබිය හැකිය. එබඳු යම් නියෝගයක් මගින් අසමාන වයස් ප්‍රමාණවලින් යුක්ත තරුණ අය අතරද, නොයෙක් පළාත්, ව්‍යාපාර, රක්ෂාවල් හා කරුණු අතරද වෙනස දක්වනු ලැබ පහත සඳහන් විධිවිධාන එකී නියෝගවල ඇතුළත් විය හැකිය :-

එකී නියෝගවලින් නියම විය හැක්කේ -

(අ) සෑම දිනක හෝ සෑම සතියක ඔවුන් සේවයෙහි යෙදිය හැකි පැය ගණන සහ දවල් කාලයේ ඔවුන් සේවයෙහි යෙදිය හැකි වේලාවන්,

(ආ) ආහාර ගැනීම හා විශ්‍රාමයන් සඳහා ඔවුන්ට ලබා දිය යුතු විවේක කාල,

(ඇ) ඔවුන්ට ලබා දිය යුතු නිවාඩු දවස් හෝ අර්ධ නිවාඩු දවස්

සහ

(ඈ) ඔවුන් සේවයෙහි යෙදීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු යම්කිසි වෙනත් කොන්දේසිය ;

(2) මේ පනතේ අන්කිසි විධිවිධානයන් සමඟ නොගැලපෙන යම් නියෝගයක් පැනවීමට මේ වගන්තියේ අංක (1) දරන උප වගන්තියේ සඳහන් කිසිවකින් බලය නොලැබිය යුතුය.

(3) මේ වගන්තියේ අංක (1) දරන උප වගන්තිය යටතේ පනවනු ලැබූ යම් නියෝගයක් උල්ලංඝනය කරන සෑම තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත් වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වැරදිකරු යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ මාස දොළහකට නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ එම තැනැත්තා යටත් විය යුතු අතර, ඊට අමතරව වරද සිදුකරනු ලැබුවේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා වෙත අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වන්දි මුදල් ද ගෙවන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතුය.

22. (1) යම් ස්ත්‍රියකගේ සේවා යෝජකයා ද, යම් තරුණ තැනැත්තකුගේ සේවා යෝජක මව්පියන්, අත්භාරකරු හෝ භාරකරු බලය ලත් නිලධාරියකු විසින් නියම කරනු ලැබුවහොත් එකී ස්ත්‍රිය හෝ තරුණ තැනැත්තා හෝ සේවයෙහි යෙදීම පිළිබඳව තොරතුරු එකී බලය ලත් නිලධාරී තැනට වුවමනා විය හැකි පරිද්දෙන්, බලය ලත් නිලධාරී තැන වෙත සැපයිය යුතුය.

(2) මේ වගන්තියේ අංක (1) දරන උපවගන්තිය අනුව, ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ , නැතහොත් යම් ස්ත්‍රියක හෝ තරුණ තැනැත්තකු සේවයෙහියෙදීම පිළිබඳව අසත්‍ය තොරතුරු බලයලත් නිලධාරියකු වෙත ඕනෑකමින්ම ඉදිරිපත් කරන්නා වූ යම් සේවා යෝජකයකු, මව්පියන්, අත්භාරකරු හෝ භාරකරු වරදකට වැරදිකරු වී, මහෙස්ත්‍රාත් වරයකු ඉදිරිපිට දී කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වැරදිකරු යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

## V වෙනි කාණ්ඩය

## සාමාන්‍ය කරුණු

23. කෘෂිකර්මයෙන්, වාණිජයෙන් හා වෙනත් කාර්මික නොවන රක්ෂා වලින් කර්මාන්තය වෙන්කොට දක්වන සීමාව නියෝග මගින් විස්තර කරනු ලැබිය යුතුය.

24. (1) ලේඛනයක් හෝ ලැයිස්තුවක් තබාගන්නා ලෙස මේ පනත මගින් නියම කරනු ලබන තැනැත්තකු, බලය ලත් නිලධාරියකුගෙන් එසේ කරන ලෙස ඉල්ලීමක් ලැබුණු විට, එබඳු නිලධාරියකුගේ පරීක්ෂණය සඳහා ලේඛනය හෝ ලැයිස්තුව ඉදිරිපත් කළ යුතුය. තවද ලේඛනයේ හෝ ලැයිස්තුවේ හෝ එහි යම් කොටසක පිටපතක් ඔහු විසින් එබඳු නිලධාරියකුට සැපයිය යුතුය, නැතහොත් එබන්දක් ලබා ගැනීමට එබඳු නිලධාරියකුට අවසර දිය යුතුය.

(2) මේ වගන්තියේ අංක (1) දරන උප වගන්තිය අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ, නැතහොත් සැලකිය යුතු තොරතුරු අතින් අසත්‍ය වූ ලේඛනයක් හෝ ලැයිස්තුවක් තබා ගන්නා වූ, නැත්නම් දැනුවත්ව පරීක්ෂණයට ඉදිරිපත් කරන්නා වූ, එසේත් නැතහොත් එලෙස ඉදිරිපත් කරනු ලැබීමට කටයුතු සලස් වන්නා වූ තැනැත්තකු වරදකට වැරදිකරු වී, මහෙස්ත්‍රාත් වරයකු ඉදිරිපිට දී කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වැරදිකරු යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

25. (1) කාර්මික ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට නැතහොත් නෞකාවකට ඇතුළු වී ස්ථානය සහ

නෞකාව සෝදිසි කරනු ලැබිය හැකිය. මේ පනත උල්ලංඝනය කරමින්, යම් තැනැත්තෙක් එහි සේවයෙහි යොදනු ලැබේද යන්න නිශ්චය වශයෙන් දැනගැනීම සඳහා එහි ඕනෑම කෙනෙකුගෙන් ප්‍රශ්න කිරීමටද, බලය ලත් නිලධාරියකුට අවසර තිබේ.

(2) යම් ස්ත්‍රියක, තරුණ තැනැත්තකු හෝ ළමයෙකු සේවයෙහි යෙදී සිටින්නා වූ හෝ සේවයෙහි යෙදී සිටිතැයි විශ්වාස කරනු ලබන්නා වූ නැතහොත් අවස්ථානුකූලව විනෝද උත්සවයකට හෝ රඟ දැක්වීමකට හෝ ඔහු හෝ ඇ හෝ සහභාගී වේ යයි හෝ සහභාගී වෙතැයි විශ්වාස කරනු ලබන්නා වූ යම් නැතහොත් ඔහු හෝ ඇ හෝ පුහුණුව ලබන්නා වූ යම් ස්ථානයකට ඇතුළු වීමට ද එහිදී ඔහු හෝ ඇ හෝ පිළිබඳව තොරතුරු විමසීමටද බලය ලත් නිලධාරියකුට අවසර තිබේ.

(3) බලය ලත් නිලධාරියකු වෙත මේ පනතින් පැවරී ඇති යම් බලතලයක් පාවිච්චි කිරීමේදී ඔහුට අවහිර කරන්නා වූ නැතහොත් මේ පනත මගින් පවත්වනු ලැබීමට බලය ලැබී ඇති යම් පරීක්ෂණයකදී පිළිතුරු සැපයීම ප්‍රතික්ෂේප කරන්නා වූ, හෝ එවැන්නකදී අසත්‍ය පිළිතුරු සපයන්නා වූ යම් තැනැත්තකු වරදකට වැරදිකරු වී මහෙස්ත්‍රාත් වරයකු ඉදිරිපිට දී කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වැරදිකරු යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

26. (1) බලය ලත් නිලධාරියකුට -

(අ) කිනම් ගණයට අයත් සේවා යෝජකයන් විසින් වුවද, ස්ත්‍රීන්, ළමයින් තරුණ තැනැත්තන් සේවයෙහි යොදනු ලැබීම සම්බන්ධයෙන් යම් තොරතුරක්

හෝ

(ආ) කිනම් ගණයට අයත් සේවා යෝජකයන් විසින් වුවද, මේ පනත යටතේ තබනු ලබන යම් ලේඛන හෝ ලැයිස්තු සම්පූර්ණව හෝ කොටස් වශයෙන්

හෝ

වුවමනා වන අවස්ථාවකදී, එහි නිලධාරියා විසින් කලාප දෙකකට නොඅඩුව ගැසට් පත්‍රයෙහි ද, ලංකාවේ ප්‍රචාරය වන්නා වූ යටත් පිරිසෙයින් එක සිංහල පුවත් පතක , එක දෙමළ පුවත් පතක හා එක ඉංග්‍රීසි පුවත් පතකත් කලාප දෙකකට නොඅඩුවද, දැන්වීමක් ප්‍රසිද්ධ කිරීමෙන් දැන්වීමේ නියම විය යුතු පරිදි තිස් දිනකට නොඅඩු එබඳු කාලයක් තුළ එබඳු තොරතුරු හෝ පිටපත් එකී නිලධාරී තැන වෙත සපයන ලෙස එකී ගණයේ සේවා යෝජකයින් හට නියම කළ හැකිය.

(2) මේ වගන්තියේ අංක (1) දරන උප වගන්තිය යටතේ පළ කරනු ලබන දැන්වීමක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ හෝ එකී උප වගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් වී ඇති අන්දමේ සේවයෙහි යෙදීම සම්බන්ධයෙන් අසත්‍ය තොරතුරු නැතහොත් එකී උප වගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් වී ඇති අන්දමට එබඳු යම් ලේඛනයක

හෝ ලැයිස්තුවක හෝ අසත්‍ය පිටපතක් සපයන්නා වූ , සෑම කෙනෙකුම වරදකට වැරදිකරුවකු වී මහෙස්ත්‍රාත් වරයකු ඉදිරිපිට දී කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු, වැරදිකරු යයි ප්‍රකාශ කරනු ලැබූ විට, රුපියල් දහසකට වැඩි නොවන දඩයකට හෝ හය මාසයකට වැඩි නොවන්නා වූ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගතවීමකට හෝ එබඳු දඩයකට හා එබඳු බන්ධනාගාර ගතවීමකට යන දඬුවම් දෙකටම යටත් විය යුතුය.

27. (1) මේ පනතේ කිසියම් විධිවිධාන උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු සේවයෙහි යෙදීම ගැන සේවා යෝජකයෙක් චෝදනා ලැබ, සිටින අවස්ථාවක දී අපරාධ නඩු විධාන සංග්‍රහයේ 148 වෙනි වගන්තියේ විධිවිධාන වලට අනුව, තමා විසින් චෝදනාවක් ඉදිරිපත් කිරීමෙන් ද, මේ වගන්තිය යටතේ ක්‍රියා කිරීමට තමා තුළ ඇති ඕනෑකම ගැන ගැන තුන් දිනකට නොඅඩු දැන්වීමක් පැමිණිලි පක්ෂය වෙත නිකුත් කිරීමෙන් ද, යථෝක්ත උල්ලංඝනය කිරීම යමෙකුගේ ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් හෝ නිසා සිදුවී ඇතැයි ඔහු ඉදිරිපත් කරන්නේ , සේවයෙහි යොදවනු ලබන තැනැත්තා හැර එබඳු යම් තැනැත්තකු, එකී අපරාධ නඩු විධාන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ විධිවිධාන වලට යටත්ව, නඩුවේ පාර්ශවකරුවකු වශයෙන් උසාවිය ඉදිරිපිටට පමුණුවනු ලැබීමට එකී සේවා යෝජකයාට හිමිකම් ලැබිය යුතුය. තවද, එබඳු අන් තැනැත්තකු වරදකරු කරනු ලැබිය හැක්කේ උල්ලංඝනය කිරීම ඔප්පු කරනු ලැබීමෙන් පසු, එබඳු අන් තැනැත්තාගේ ක්‍රියාව හෝ පැහැර හැරීම හේතුකොට ගෙන උල්ලංඝනය සිදුවී යයි උසාවියට ඒත්තු යන පරිදි සේවා යෝජකයා ඔප්පු කළහොත්ය ;

තවද, ඉහත සඳහන් විධිවිධාන වලට අනුව ක්‍රියා කිරීම අවශ්‍ය යැයි තහවුරු කිරීම පිණිස තමා නිසි උනන්දුව දක්වා ඇති බව උසාවියට ඒත්තු යන පරිදි, සේවා යෝජකයා වැඩිදුරටත් ඔප්පු කළහොත්, ඔහු චෝදනාවෙන් නිදහස් කරනු ලැබිය යුතුය. එබඳු අන් තැනැත්තකුට විරුද්ධව පැමිණිලි ඉදිරිපත් කිරීම සේවා යෝජකයා විසින් හෝ ඔහු වෙනුවට හෝ මෙහෙයවනු ලැබිය යුතුය.

(2) මේ වගන්තියේ අංක (1) දරන උප වගන්තියේ සඳහන් අන්දමේ සේවා යෝජකයකු එකී උප වගන්තියෙහි දැක්වෙන විධිවිධාන වලින් ප්‍රයෝජන ලබන අවස්ථාවකදී-

(අ) අනෙක් තැනැත්තාට විරුද්ධව නීති කෘත්‍යයේදී ඔහු සාක්කි දෙතොත් , ඔහුට විරුද්ධව නීති කෘත්‍යයේදී ඔහුගෙන් ද අනෙක් තැනැත්තාට විරුද්ධව ඔහුගේ චෝදනාවකට

පක්ෂව ඔහු විසින් කැඳවනු ලබන යම් සාක්ෂිකරුවකුගෙන් ද, හරස් ප්‍රශ්න ඇසීමේත්, තර්ක බිඳ හෙළන සාක්ෂි කැඳවීමේත්, අයිතිවාසිකම් චෝදකයා සතු විය යුතුය ; තවද

(ආ) නීති කෘත්‍යයේ යම් පාර්ශවකරුවකු විසින් එහි අන්කිසි පාර්ශවකරුවකුට රුපියල් විසි පහකට වැඩි නොවන නඩු ගාස්තුවක් ගෙවීම සඳහා උසාවිය සුදුසුයයි කල්පනා කරන පරිදි, ආඥාවක් පැනවිය හැකිය. ගෙවනු ලැබීමට එසේ නියම වන යම් මුදලක්, උසාවියෙන් නියම කරනු ලබන දඩ මුදලක් අය විය යුතු ආකාරයෙන්ම අයකර ගත යුතුය.

28. (1) සේවා යෝජකයකු විසින් යම් ලේඛනයක හෝ ලැයිස්තුවක හෝ යම් සටහනක් සඳහන් කළ යුතු යැයි මේ පනත මගින් හෝ මේ පනත යටතේ හෝ නියම වී ඇති අවස්ථාවකදී එකී සේවා යෝජකයා විසින් හෝ ඔහු වෙනුවට හෝ කරනු ලබන එබඳු යම් සටහනක් ඔහුට විරුද්ධව එකී ලේඛනයේ හෝ ලැයිස්තුවේ සටහන් කරනු ලබන කරුණක් ලෙස පිළිගත හැකි විය යුතුය.

(2) මේ පනතේ යම් විධිවිධානයක් මගින් හෝ යම් නියෝගයක් මගින් හෝ යම් ලේඛනයක හෝ ලැයිස්තුවක හෝ සඳහන් විය යුතු යැයි නියම වී ඇති යම් සටහනක් කරනු ලැබී නැත යන්න එබඳු විධිවිධානයක් අනුව, ක්‍රියා නොකරන ලදැයි සාක්ෂි වශයෙන් පිළිගත හැකි විය යුතුය.

29. කම්කරු කොමසාරිස් වරයා විසින් හෝ එතුමාගේ අවසරය ලියවිල්ලකින් ලබාගෙන මිස, කිසිම වරදක් සම්බන්ධයෙන් මේ පනත යටතේ පැවරීමක් නොකළ යුතුය.

30. (1) තරුණ තැනැත්තකු මෙන් හෝ ළමයෙකු මෙන් පෙනී සිටින යම් තැනැත්තකු , ඔහුගේ වයස නිශ්චය වශයෙන් දැනගැනීම සඳහා හෝ මේ පනතේ අන්කිසි කාර්යයක් සඳහා පරීක්ෂා කරන ලෙස නියෝග කිරිමට බලය ලත් නිලධාරියකුට පිළිවන. පරීක්ෂණයට භාජනය කළයුතු තැනැත්තාගේ සේවා යෝජකයා විසින් අවශ්‍ය වන අවස්ථාවකදී, සේවය කරන ස්ථානයට ඇතුළු වී, එකී තැනැත්තා වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

“ (1අ) යම් රජයේ වෛද්‍ය නිලධරයකු විසින් ඉහත (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු පරීක්ෂා කරනු ලබන අවස්ථාවක ඔහු විසින් පරීක්ෂා කරනු ලැබූ එකී තරුණ අයගේ හෝ ළමයාගේ වයස සම්බන්ධයෙන් සහතිකයක් නිකුත් කිරීම එකී වෛද්‍ය නිලධරයාගේ කාර්යය වන්නේ ය. තව ද, එකී සහතිකය අධිකරණයක දී සාක්ෂි වශයෙන් පිළිගත හැකි අතර එහි සඳහන් කරුණු පිළිබඳ බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් විය යුත්තේ ය ”

“ (2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන සෑම සේවායෝජකයකු ම වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත් වරයකු ඉදිරියේ දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතුය.”

31. (1) මේ පනත මගින් නියෝග පැනවිය යුතු යයි නියම වී ඇත්තා වූ හෝ නියෝග පැනවීමට අවසර ලැබී ඇත්තා වූ සියළු කරුණු සම්බන්ධයෙන් ද, මේ පනත යටතේ නියම කරනු ලැබිය යුතුව හෝ නියම කරනු ලැබීමට අවසර ලැබී ඇත්තා වූ සියලු කරුණු නියම කිරීම සඳහා ද නියෝග සකස් කිරීමට ඇමතිවරයාට පිළිවන.

(2) උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයක් මගින් අනුමත කරනු ලැබ, එබඳු අනුමතය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තෙක්, ඇමතිවරයා විසින් පනවන ලද නියෝගයක් ක්‍රියාත්මක නොවිය යුතුය.

(3) ඇමතිවරයා විසින් සකස් කරනු ලැබ, උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයක් මගින් අනුමත කරන ලද නියෝගයක් එබඳු අනුමතය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන විට, මෙහිලා පනවනු ලබන්නන් පමණටම වලංගුව ද, සාර්ථකව ද, තිබිය යුතුය.

32. (1) මේ පනතේ විධිවිධාන, ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදීම සම්බන්ධයෙන් ලංකාවේ වලංගුව පවත්නා අන්කිසි ලිපිගත නීතියකට අතිරේක වශයෙන් ද, හානි නොපමුණුවන ලෙසද තිබිය යුතුය.

එසේ වුවද, මේ පනත ද අන්කිසි ලිපිගත නීතියක් ද අතර සට්ටනයක් ඇතිවන නඩුවකදී මේ පනතේ විධිවිධාන බලපෑ යුතුය.

(2) විනෝද උත්සව වලට ළමයින් සේවයෙහි යෙදීම හෝ විනෝද උත්සව වලට ළමයින් සහභාගිවීම සම්බන්ධයෙන් සීමා කිරීම පනවන මේ පනතේ විධිවිධාන ද, නියෝග වල විධිවිධාන ද ;

(අ) අධ්‍යාපනය හා සම්බන්ධව තාවකාලිකව ක්‍රියාවේ යෙදෙන යම් ලිපිගත නීතියක ඇතුළත් විය හැකි, පාසලට පැමිණීම පිළිබඳ යම් විධිවිධාන කෙරෙහි බල නොපෑ යුතුය. ; තවද

(ආ) පිළිගත් පාසලක හෝ යම් නියමිත ආයතනයක හෝ රඳවා ගනු ලැබ, සිටින තැනැත්තකුට අදාළ නොවිය යුතුය.

මේ උප වගන්තියෙහි " පිළිගත් පාසැල " යන්නට 1939 අංක 48 දරන ළමයින් හා තරුණ අය පිළිබඳ ආඥාපනතේ ඇතුළත් අර්ථයම යෙදී ඇත්තේය.

33. (1) පහත සඳහන් ආඥා පනතේ මෙයින් අවලංගු කරනු ලැබේ:-

(අ) ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් පිළිබඳ ආඥාපනත.

(ආ) 1940 අංක 16 දරන ස්ත්‍රීන් සේවයෙහි යෙදීමේ සංශෝධිත ගිවිසුම් ආඥාපනත

(2) 1939 අංක 48 දරන ළමයින් හා තරුණ අය පිළිබඳ ආඥා පනතේ IV වෙනි කාණ්ඩය මෙයින් අවලංගු කරනු ලැබේ.

34. (1) මේ පනතෙහි පද සංසන්දනයෙන් වෙනස් අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, පහත සඳහන් පාඨයන්ගේ අර්ථය පහත දැක්වෙන පරිදි වන්නේය. –

" බලයලත් නිලධරයා" යන්නෙන් කම්කරු කොමසාරිස්වරයා, අතිරේක කම්කරු කොමසාරිස්වරයා, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයකු සහ සහකාර කම්කරු කොමසාරිස්වරයකු, අදහස් වන අතර ඊට යම් වෛද්‍ය නිලධරයකු, කර්මාන්තශාලා පරීක්ෂා කිරීමේ ප්‍රධාන ඉංජිනේරුවරයා, කර්මාන්තශාලා පරීක්ෂා කිරීමේ ඉංජිනේරුවරයකු, යම් කම්කරු නිලධරයකු හෝ කම්කරු දෙපාර්තමේන්තුවට සම්බන්ධ යම් සංඛ්‍යාලේඛන නිලධරයකු හෝ යම් සංඛ්‍යාලේඛන විශේෂඥයකු ද ඇතුළත් වේ. "

"ළමයා" යන්නෙන් වයස අවුරුදු දහ හතරට අඩු තැනැත්තකු අදහස් කෙරෙයි.

"ළමයා" යන යෙදුමේ අර්ථකථනයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :

" අත්භාරකරු " යන්නෙන් ළමයාගේ භාරකාරත්වය දැරිය යුතු වන්නා වූ සහ ළමයා වෙනුවෙන් ඒ ළමයාගේ කටයුතු කළමනාකරණය කළ යුතු ද වූ, අධිකරණයක් විසින් පත් කරනු ලැබූ යම් තැනැත්තකු අදහස් වේ.

" සේවා යෝජක " යනුවෙන් අදහස් වන්නේ යම් ස්ත්‍රියක තරුණ අයකු හෝ ළමයකු, තමාම වෙනුවෙන් හෝ තමා වෙනුවෙන් අන්කිසි තැනැත්තකු හෝ සේවයෙහි යොදන යම් කෙනෙකි. තවද, යම් ස්ත්‍රියක, තරුණ අයකු හෝ ළමයකු අන්කිසි තැනැත්තකු වෙනුවෙන් සේවයෙහි යොදන කෙනෙක් ද, ඊට ඇතුළත් වෙයි.

සේවා යෝජකයකු පිළිබඳව යොදා ඇති “ පවුල ” යන්නෙන් සේවා යෝජකයාද , සේවා යෝජකයාගේ භාර්යාව හෝ පුරුෂයාද , සේවා යෝජකයාගේ ළමයින් ඇතොත් ඔවුහු ද අදහස් වෙති.

“ කාර්මික ව්‍යාපාරය ” –

(අ) යන පාඨයට ස්ත්‍රීන් රෑ වැඩහි යෙදී සම්බන්ධව විශේෂයෙන් ඇතුළත් වන්නේ---

I. පතල් හා ගල් වළවල් වල වැඩ කරගෙන යාමේ හො පෘථිවියෙන් ඛණිජ වර්ග ඇද ගැනීම සඳහා කරනු ලබන වෙනත් කර්මාන්තවල හෝ යෙදෙන ව්‍යාපාර :

II. භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන්නා වූ හෝ වෙනස් කරනු ලබන්නා වූ, හෝ පිරිසිදු කරනු ලබන්නා වූ, හෝ අලුත් වැඩියා කරනු ලබන්නා වූ, හෝ අලංකාර කරනු ලබන්නා වූ, හෝ වැඩ අවසන් කරනු ලබන්නා වූ, විකිණීම සඳහා සකස් කරනු ලබන්නා වූ, කඩා දමනු ලබන්නා වූ නැතහොත් බිඳ හෙළනු ලබන්නා වූ ව්‍යාපාර, හෝ ද්‍රව්‍ය සම්පූර්ණයෙන් වෙනස් කරනු ලබන්නා වූ ව්‍යාපාර :

III. නෞකා තැනීම පිළිබඳව නැතහොත් විදුලිය හෝ ඕනෑම ආකාරයක චලන ශක්තියක් නිපදවීම, පරිවර්තනය හෝ සංප්‍රේෂණය පිළිබඳව යොදනු ලබන ව්‍යාපාර : සහ

IV. ගොඩනැගිලි තැනීම හා සිවිල් ඉංජිනේරු කටයුතු පිළිබඳව හෝ නිර්මාණය පිළිබඳ අලුත්වැඩියා කිරීම, පවත්වාගෙන යාම, වෙනස් කිරීම හෝ බිඳ හෙළීමේ කටයුතු පිළිබඳව යොදනු ලබන ව්‍යාපාර :

(ආ) “ කාර්මික ව්‍යාපාරය ” යන පාඨයට, වයස අවුරුදු දහ අටෙන් පහළ තැනැත්තන් සේවයෙහි යෙදීම සම්බන්ධව, විශේෂයෙන් ඇතුළත් වනනේ ---

(1) මේ උප වගන්තියේ (අ) ඡේදයේ නියමිත ව්‍යාපාර ; සහ

(11) මගීන් හෝ බඩු හෝ, මහා මාර්ගයෙන් හෝ දුම්රිය මාර්ගයෙන් හෝ ගෙන යාම පිළිබඳව, නැතහොත් නෞකාගාර වලදී , නැව් තොටවලදී, රේගු වලදී, ගුදම් වලදී හෝ ගුවන් තොටුපල වලදී බඩු බෑම හෝ පැටවීම පිළිබඳව යොදනු ලබන ව්‍යාපාරය ;

තවද,

(ඇ) “ කාර්මික ව්‍යාපාරය ” යන පාඨයට, වයස අවුරුදු දහ හතරෙන් පහළ තැනැත්තන්

සේවයෙහි යෙදීම සම්බන්ධව, විශේෂයෙන් ඇතුළත් වනනේ ---

(1) මේ වගන්තියේ ( අ ) ඡේදයේ අංක (1) , (11) හා (111) දරන අනුඡේදවල නියමිත ව්‍යාපාර;

(11) යම් ගොඩනැගිල්ලක්, දුම්රිය මාර්ගයක්, විදුලි රථ මාර්ගයක්, වරායක්, නෞකාගාරයක්, ගොඩ බසින පාලමක්. ඇලක්, වාරි මාර්ගයක්, පාරක්, උමගක්, පාලමක්, බෝක්කු සහිත පාලමක්, කුණු දිය අගලක්, කාණුවක්, ලිඳක්, විදුලි පණිවුඩ යැවීම හෝ ටැලිෆෝන් මගින් කථා කිරීම හෝ සම්බන්ධ උපකරණ, විදුලි කර්මාන්ත ව්‍යාපාරයක්, ගෑස් වැඩ පොළක්, වාරි කර්මාන්තයක් හෝ නිර්මාණය පිළිබඳ වෙනත් ව්‍යාපාරයක් හෝ ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම, පවත්වාගෙන යාම, ප්‍රකෘතිමත් කිරීම, වෙනස් කිරීම හෝ බිඳ හෙලීම මෙන් ම එබඳු යම් ව්‍යාපාරයකට හෝ ගොඩනැගිල්ලකට කටයුතු සූදානම් කිරීම හෝ එබන්දක අත්තිවාරම් දැමීම : සහ

(111) මහා මාර්ගයෙන් හෝ දුම්රියෙන් හෝ අභ්‍යන්තර වාරි මාර්ගයකින් මගින් හෝ බඩු ගෙන යාම සහ නෞකාගාර වලදී, නැව් තොටවලදී, රේගුවලදී හා ගුදම් වලදී බඩු බෑම සහ පැටවීමත්ය. එහෙත් බඩු උසුලා ගෙනයාම මීට ඇතුළත් නොවේ.

(අ) ස්ත්‍රීන් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් අදහස් වන්නේ ප.ව. 10.00 - පෙ. ව. 5.00 අතර කාලය ඇතුළත ඉතා අඩු වශයෙන් අනුක්‍රමයෙන් එළඹෙන පැය 11 කි. ;
තවද,

(ආ) වයස අවුරුදු දහ අටෙන් පහළ තැනැත්තන් සේවයෙහි යෙදීම සම්බන්ධව එයින් අදහස් වන්නේ පෙරවරු 6 පසු නොවී කෙළවර විය යුතු, අනුක්‍රමයෙන් එළඹෙන, ඉතා අඩු වශයෙන් පැය දොළහකි ; තවද මේ කාලසීමාවට --

(1) එකී තැනැත්තන් අතුරෙන් වයස අවුරුදු දහසයෙන් පහළ එබන්දක් පිළිබඳව පස්වරු 10 ටත්, පෙරවරු 6 ටත් අතර අනුක්‍රමයෙන් යෙදෙන පැය අට ඇතුළත් විය යුතුය.

(11) එකී තැනැත්තන් අතුරෙන් වයස අවුරුදු දහසයකට එළඹ සිටින එබන්දක් පිළිබඳව , (111) වෙනි අනුච්ඡේදයේ විධිවිධානවලට යටත්ව, පස්වරු 10 ටත් පෙරවරු 6 ටත් අතර

අනුක්‍රමයෙන් එළඹෙන ඉතා අඩු වශයෙන්, පැය හතක් ඇතුළත් විය යුතුය.

තවද,

(111) එකී තැනැත්තන් අතුරෙන් වයස අවුරුදු දහසයකට එළඹ සිටින්නා වූ ද , බේකරි කර්මාන්තය පිළිබඳ ආධුනිකයන් වූද, තැනැත්තන් පිළිබඳව, එකී කර්මාන්තය පිළිබඳ රෑ වැඩ කිරීම සියලු කම්කරුවන් සඳහා තහනම් කර තිබේ නම්, ගැසට් පත්‍රයෙහි පළකරන ලද නියෝගයකින් ඇමතිවරයා එලෙස නියම කළහොත් (11) වෙනි අනුච්ඡේදයෙහි සඳහන් වන, අනුකූමයෙන් එළඹෙන ඉතා අඩු වශයෙන් වූ පැය හතක කාල සීමාව වෙනුවට පස්වරු 9 ටත් පෙරවරු 4 ටත් අතර වූ අනුක්‍රමයෙන් එළඹෙන ඉතා අඩු වශයෙන්, පැය හත ඇතුළත් විය යුතුය.

“ අනතුරු සහිත ස්වභාවයකින් යුත් රඟ දැක්වීම ” යන්නට කරනම් ගැසීම සම්බන්ධ සියලු රඟ දැක්වීම් ද, ඇඟ දඟර ගසන්නකු ලෙස කරන සියලු රඟ දැක්වීම ද ඇතුළත් වෙයි;

“ නියමිත ” යනුවෙන් අදහස් වන්නේ නියෝග මගින් නියම කරනු ලැබූ යන වගය;

“ නියෝග ” යන්නෙන් අදහස් වන්නේ මේ පනත යටතේ පනවනු ලැබූ නියෝගයකි.

“ යාත්‍රාව ” යන්නට කිනම් ස්වභාවයකින් හෝ යුක්ත වූ ද, සමුද්‍ර තරණයෙහි නියුක්ත වූ ද, පොදු ජනයා සතුව හෝ පුද්ගලික අයිතිය යටතේ හෝ පවත්නා වූ නෞකාවක් හෝ බෝට්ටුවක් ඇතුළත් වේ. එහෙත් ඊට යුද්ධ නෞකාවක් ඇතුළත් නොවේ.

“ ස්ත්‍රී ” යන්නෙන් අදහස් වන්නේ වයස අවුරුදු 18 ට එළඹ සිටින ස්ත්‍රී ලිංගික තැනැත්තෙකි.

“ තරුණ තැනැත්තා ” යන්නෙන් අදහස් වන්නේ වයස අවුරුදු 14 ට එළඹ සිටින්නා වූ එහෙත් වයස අවුරුදු 18 ට පහළ තැනැත්තෙකි.

(2) මෙම පනතේ හා යම් නියෝගයක ද කාර්ය සඳහා --

(අ) මූලික පාසැලක ඉගෙනීම ලබන්නා වූ ද, පාසල් වාරයකදී වයස අවුරුදු 14ට එළඹෙන්නා වූ තැනැත්තෙක් එම වාරය අවසන් වන තෙක් ළමයකු වීමෙන් තොර වූවෙක් යැයි සළකනු නොලැබිය යුතුය;

(ආ) ලාභ ඉපයීම් සඳහා පවත්වා ගෙන යනු ලබන වෙළඳාමට හෝ ව්‍යාපාරයකට සහාය වන තැනැත්තෙක් ස්වකීය මෙහෙය සඳහා කිසිම පාරිතෝෂිකයක් නොලබද්දී සේවයෙහි යොදනු ලැබේ යයි සලකනු ලැබිය යුතුය ;

තවද,

(ඇ) ආගමික දේව මෙහෙයකට සහභාගී වන්නා වූ හෝ ආගමික දේව මෙහෙයක් සඳහා පුහුණුවන්නා වූ “ ගායකයෙක් ” මේ පාරිතෝෂිකයක් ලබතත්, නොලබත් සේවයෙහි යොදනු ලැබේ යයි සළකනු නොලැබිය යුතුය.